සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2022(2023)

# 71 - සිංහල

## ලකුණු දීමේ පටිපාටිය



15/100

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

CamScanner

# උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තර පත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තර පත්‍ර ලකුණු කිරීමට රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තර පත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනුකොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ................................................ | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ................................................ | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ................................................ | √ | △ $\frac{3}{5}$ |

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තර පත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තර පත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තර පත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

## අභිමතාර්ථ

**I පත්‍රය**

අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් සතු ව පවතින:

- සම්භාව්‍ය සිංහල (නිර්දිෂ්ට) ගද්‍ය හා පද්‍ය කෘති කියවා අවබෝධ කර ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම ද
- නූතන ගද්‍ය-පද්‍ය හා කාව්‍ය නිර්මාණ රස විඳීම හා තදනුබද්ධ විචාරාත්මක දෘෂ්ටිය කෙබඳු දැයි හඳුනා ගැනීම ද
- කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන රස විඳීම හා විචාරය කිරීමේ ශක්‍යතාව මැන බැලීම ද මේ පත්‍රයෙන් අපේක්ෂිත ය.



CamScanner

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2022 (2023)

## 71 - සිංහල I

## ලකුණු බෙදී යාම

### I පත්‍රය

මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය :-** මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් (07) සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 යි (4 x 4 = 16)

  (මේ කොටස් පහෙන් සතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 යි (3 x 4 = 12)

  (i, ii, iii, iv,v, vi, vii මේ කොටස්වලින් අවස්ථා සතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)

- (එ) රසාස්වාදය - ලකුණු 12 යි.

  ලකුණු 40යි.

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරෙන් සතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි. (2 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි.)

(iv) දඹදෙණි අවධියේ දී බුද්ධ පුත්‍ර හිමියන් විසින් ලියන ලද පූජාවලියේ අනුරුද්ධ කුමාර කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි.

රාජකුමාරවරුන් තම ආභරණ පොදියක් කොට බැඳ උපාලි කපුවා අතට දී නික්මුණු කල එම ආභරණ ළඟ තබා ගැනීමේ අනතුර දකින ඔහු එය ගසක එල්ලා, තමාට ම මෙසේ පවසා ගනී.

(v) දඹදෙණි අවධියේ දී ධර්මසේන හිමියන් විසින් ලියන ලද සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේසිගේ වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි.

සොරපව්ව මුදුන දී කුණ්ඩලකේසිය විසින් තම සැමියා (සොරා) පර්වතයෙන් පහළට පෙරළා දැමූ අවස්ථාව දකින සොරපව්වේ වසන දේවතාවා මෙසේ පවසයි.

(vi) දඹදෙණි අවධියේ දී බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියේ ජීවක කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි.

බිම්බිසාර රජතුමා භගන්දරාබාධයෙන් පෙළීම හේතුවෙන් සළුපටෙහි තැවරී ඇති ලේ දකින අන්තඃපුර කාන්තාවෝ රජුට මෙසේ පවසති.

(vii) පන්සිය පනස් ජාතක පොතේ චන්ද කින්නර ජාතක කථාවෙන් උපුටා ගත් පාඨයකි.

හිමාලය වනයේ දී කිඳුරාට විදීමෙන් අනතුරු ව, දුකට පත් කිඳුරිය සැනසීම සඳහා බ්‍රහ්මදත්ත රජ කිඳුරියට මෙසේ පවස යි.

ලකුණු දීමේ නිර්ණායක
කතුවරයා, කෘතිය, කථා වස්තුව/කතාව සඳහා ලකුණු 01යි.
කා විසින් කාට කියන ලද ද ලකුණු 01යි.
අවස්ථාවට ලකුණු 01 යි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

| | | |
|---|---|---|
| සිංහල | II | **71 S II** |
| சிங்களம் | II | |
| Sinhala | II | |

| | | | |
|---|---|---|---|
| පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* | අමතර කියවීම් කාලය<br>மேலதிக வாசிப்பு நேரம்<br>Additional Reading Time | - | මිනිත්තු 10 යි<br>10 நிமிடங்கள்<br>10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය / සුපරීක්ෂකගේ අත්සන ........................

**උපදෙස්:**

- I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මේ ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 මූර්ධජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ක ට ඨ ඝ ඪ ළ ණ (2) ට ස ප ර ණ ප ළ
(3) ග ර ක ට ඩ ණ ළ (4) ක ට ඨ ඩ ණ ර ෂ
(5) ළ ණ ට ඩ ධ ක ර (.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) රසාස්වාදය, සඳළුතලය, විශ්ලේෂණය, කාලගුණය, ග්‍රන්ථාරූඪ
(2) රසාස්වාදය, සදළුතලය, විශ්ලේෂණය, කාලගුනය, ග්‍රන්තාරූඪ
(3) රසාස්වාදය, සඳලුතලය, විශ්ලේෂණය, කාලගුණය, ග්‍රන්ථාරූඪ
(4) රසාස්වාදය, සඳළුතලය, විස්ලේෂණය, කාලගුණය, ග්‍රන්ථාරූඩ
(5) රසාශ්වාදය, සඳලුතලය, විශ්ලේශනය, කාලගුනය, ග්‍රන්ථාරූඪ (.....)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සැළලිහිණිය, සාරාර්ථ සංග්‍රහය, සුභාෂිතය
(2) සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, සැළලිහිණිය, සුභාෂිතය
(3) සද්ධර්මාලංකාරය, සැළලිහිණිය, සද්ධර්මරත්නාවලිය, සුභාෂිතය, සාරාර්ථ සංග්‍රහය
(4) සද්ධර්මරත්නාවලිය, සුභාෂිතය, සාරාර්ථ සංග්‍රහය, සැළලිහිණිය, සද්ධර්මාලංකාරය
(5) සද්ධර්මාලංකාරය, සැළලිහිණිය, සුභාෂිතය, සද්ධර්මරත්නාවලිය, සාරාර්ථ සංග්‍රහය (.....)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යංශය සැම විට ම ව්‍යඤ්ජනයක් හා සංයෝග ව ම යෙදේ.
(2) පදයක ආරම්භයෙහි යංශය යෙදිය හැකි ය.
(3) යංශය ඕනෑ ම ව්‍යඤ්ජනයකට පසු ව යෙදිය හැකි ය.
(4) යංශය සමග රකාරාංශය භාවිත වෙයි.
(5) 'ය' වෙනුවට 'ෘ' ද, 'ෘ' වෙනුවට 'ය' ද යෙදේ. (.....)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ශිෂ්‍ය සේනාංකය, නිශේධ බලය, ඉන්ධන හිඟය, මිනිස් ප්‍රජාව
(2) ආනුමණික ගාත, පැරණි සිද්ධස්ථාන, මාසික උපහාර, ග්‍රහලෝක තරණය
(3) ප්‍රත්‍යක්ෂ හිංසා, ගැමි දිවිය, ආරක්ෂක අමාත්‍යාංශය, කෝවිල් සඳෙස
(4) සුදු භූමිය, මංගල ගමන, නිවාස පැලපුම්, වෛද්‍ය පරීක්ෂණය
(5) ජනපති මැදුර, උදා වැනුම, භෞතික සැප, දවල් ආහාරය (.....)

[දෙවැනි පිටුව බලන

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ප්‍රකෘති, විකෘති, ආකෘති, සංස්කෘති
(2) ධන, ධාතු, දළ, ධර්ම
(3) මාර්ග, වර්ග, සග, දුර්ග
(4) චරණ, කරණ, පැරණි, කිරණ
(5) හර, රාග, භාග, බැම (......)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) කම, දම, ධුම, මුනි
(2) වක, සක, දුක, ගෙයක්
(3) සස, දන, විෂ, අදස
(4) අගන, තුරඟ, අසුරු, රංගන
(5) සුමිසුරු, ලොවිසුරු, සිව්සුරු, වෙසසුරු (......)

1.8 අන්‍යාර්ථ, විභක්ති, අව්‍යය සහ විශේෂණ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) දසබල, නැඹිලිතෙල්, දුබල, නිල්මානෙල්
(2) නැඹිලිතෙල්, දුබල, දසබල, නිල්මානෙල්
(3) දුබල, නිල්මානෙල්, දසබල, නැඹිලිතෙල්
(4) නැඹිලිතෙල්, දසබල, දුබල, නිල්මානෙල්
(5) දසබල, දුබල, නැඹිලිතෙල්, නිල්මානෙල් (......)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) නිදන, කවන, පතන, දුවන
(2) වසිරි, පැසිරි, ඉසිරි, වැකිරි
(3) පැනීම, දිවීම, ලිවීම, බැලීම
(4) ඉවසිලි, මැසිරිලි, පෙරළිලි, පෙරවිලි
(5) පිපුණු, වැටුණු, දරුණු, බැඳුණු (......)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "දිවි රන්වන් කැලුම් එක විට"
(ආ) "දුකින් දුක් දුරු වේවා"
(ඉ) "නොවසව් නෙපි මියෙත"
(ඊ) "අවුත් බෝසතුනු දිනවන ලෙස"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අතීතකාල ක්‍රියා, ආශීර්වාද ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, අතීතකාල ක්‍රියා
(3) ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අතීතකාල ක්‍රියා
(4) අතීතකාල ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
(5) අතීතකාල ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා (......)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) දැවමුවා, පිදුමුවා, පෙල්මුවා, රන්මුවා
(2) සිසිලස්, වරලස්, අල්ලස්, මුහුලස්
(3) ධනවත්, කුලවත්, ආශ්චර්යවත්, භාග්‍යවත්
(4) කිනිති, කවිති, සිහින, පැහිති
(5) කෞශල්‍යය, සෞභාග්‍යය, ශෛක්ෂ්‍යය, සෞන්දර්‍යය (......)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පෙළක් තෝරන්න.
(1) පිළිසඳර, පිළිමල්, පිළිතුරු, පිළිවිද
(2) අවකැන්, අවගුණ, අවමන්, අවමගුල්
(3) කුදිටු, කුකවි, කුහුදල්, කුපුරිස්
(4) අනුගත, අනුකූල, අනුමාන, අනුදැනුම
(5) විකාල, විරූප, විගමන, විදේශ (......)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) විසින්, පිණිස, කෙරෙන්, කෙරෙහි
(2) හෝ, අහෝ, අනේ, අපොයි
(3) එසා, නැවත, නොහොත්, හෙවත්
(4) එදා, අද, දවස, හෙට
(5) ද, ම, ගෙන, හා (......)

[තුන්වැනි පිටුව බලන්න.

1.14 "කෝකිලනාදය අසා පමුදිත වූ වරාංගනාවෝ අසිරිමත් වනසිරි වින්දහ" යන වාක්‍යයෙහි වචන බෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ ආකෘතිවලට ද?

(1) තද්ධිත, සන්ධි, සමාස
(2) සන්ධි, තද්ධිත, සමාස
(3) තද්ධිත, සමාස, සන්ධි
(4) සමාස, සන්ධි, තද්ධිත
(5) සමාස, තද්ධිත, සන්ධි (.....)

1.15 සම්මත ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) මහළුත්ති, හදත්ති, කොටන්නෝ, අමත්ති
(2) එව්, කව්, බොව්, යවු
(3) සියතුව, මලතුව, අසතුව, සඩතුව
(4) පිහිනන, කරගොත්, හටින, බලන
(5) කවා, පොවා, නාවා, කියා (.....)

1.16 සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මදාරජතෙල්, ඇඳපුටු, ගොඩබිඩ, පින්පව
(2) අදහම, අරුත්, අපුම, අවැව
(3) සුවඳදුම්, රතුවළිය, දුරගමන්, කහටරස
(4) පසිඳුරෝ, සදිසා, සිවුකොන්, සත්සමුදුර
(5) රත්කෝටු, දඬුවැට, ගල්පිළිමය, වැව්මාළු (.....)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) පුනරාගමනය, විදුරම්, නිරාකුල, දුර්වාර
(2) දේවාසුර, කුශලාකුශල, පාපොච්චාරණය, සත්‍යාසත්‍ය
(3) අංගෝපාංග, පුෂ්පෝපහාර, ශබ්දෝච්චාරණ, ප්‍රබන්ධෝපදේශ
(4) පිනැති, දහම්සුරු, දිවැස්, මුදුසුරු
(5) සිතැති, දිනැති, නෙතැති, බලැති (.....)

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන වරණය කුමක් ද?

(1) දුර්ගුණ, වර්ණනා, නිර්මාණ, නිර්ණායක
(2) බලවමින්, ලියවමින්, නටවමින්, හඩවමින්
(3) මින්මැදුර, දත්සැල, සාරිරෙදි, පින්පෙට්ටිය
(4) සුසිනිඳු, සුවිසල්, සුපසන්, සුනිමල්
(5) බලන්න, අසන්න, සිටින්න, නගින්න (.....)

1.19 ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) සියලු ක්‍රීඩකයන් පිට්ටනිය පුරා විසිරී ගියහ.
(2) උත්සව සභාවට ආගමික නියෝජිතයන් ද පැමිණෙති.
(3) ගුණපාල ද සිරිපාල ද අප පාසලේ ගුරුවරු ය.
(4) දියකිඹියෝ මුදුපුදට සැරසුණ ය.
(5) ඔවුහු සංගමයේ ක්‍රියාකාරීහු මෙන් ම එහි පැවැත්මට වෙහෙසිව පුද්ගලයෝ ද වෙති. (.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) ඇති යාන්තං මේ පැත්තෙත් ඇවිත් යන්න ආවා.
(2) කාගේ කාගෙත් කිල්ලෝට්ටුවල හුණු ටික ටික තියෙනවයි කියන්නේ.
(3) නිද්දාපේ මඟුල් කාලා මං ඒකි කැන්දන් එන්නේ.
(4) මාමණ්ඩිත් එක්ක පැල් කොටේට යන්න බැහැ හරි මනාප යි.
(5) දෙමාපියන්ගේ යුතුකම වන්නේ දරුවන්ගේ සිත් තුළ පරිසරය ගැන ඇල්ම වැඩි කිරීම යි. (.....)

(ලකුණු 20 යි.)

**

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

### අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

**II පත්‍රය**

විෂය අංකය / பாட இலக்கம் : **71**

විෂයය / பாடம் : **සිංහල**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

**I කොටස**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 4 | 11. | 2 |
| 02. | 3 | 12. | 3 |
| 03. | 2 | 13. | 4 |
| 04. | 1 | 14. | 4 |
| 05. | 3 | 15. | 3 |
| 06. | 1 | 16. | 2 |
| 07. | 5 | 17. | 3 |
| 08. | 1 | 18. | 1 |
| 09. | 5 | 19. | 3 |
| 10. | 4 | 20. | 5 |

**විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :**

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீ

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 =

1. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් ඕනෑම තුනක් තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) සොරාගේ ද සිත දවසෙකින් කළ උපකාරක් නොසලකා 'මැ මරාපියා මැගේ ආභරණ හැරගෙන රා බී ඇවිදිනවුන්ට විකොටපියා අභිප්‍රාය දෙයක් හැරගෙන නාපියන්නේ කවර දවසෙක දොහෝ'යි සිතිය. සිතාලා ඒක් උපදෙසක් සලකාලා බිත් නොනා නැදව නැගිලා වැද්ගොත්තෝය. සිටුදුවණියෝ ගොසින් ලෙඩක් නියා දැයි විචාරා නැතැ'යි කී කල්හි 'අපගේ දෙමව්පියන්ගෙන් මුසුප්පුවක් ඇති නියා දැ'යි විචාරා 'එයින් නැතැ'යි කී කල්හි 'එසේ කල මුසුප්පු නැයි දැ'යි කිවුය. 'සොඳුර, එදවස් මරන්ට ගෙනයන ගමනේ සොරුන් හෙළන ගල වසන දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම අනුභාවයෙන් මාගෙන් කිසිත් වියදමක් නැති ව තොපත් ලදිමි. උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි'යි කිවුය. 'එවිතරෙක් වී නම් මුසුප්පු වන්ට නොකැමැත්තේය. පිදේනිය පුදමි. වුවමනා කිම් දැ'යි විචාරා 'ලදපස්මල් හා සමග පැන් තුඹිස කිරිබත් වුවමැනැවැ'යි කී කල්හි 'යහපතැ'යි මුළුල්ල ම සපයාලා 'එන්න, යමිත'යි කිවුය.

(i) සොරා කනගාටුවට පත්වූයේ කවර හෙයින් ද?
(ii) සොරා සිටුදියණියන්ගේ ආභරණ විකිණීමට සිතුවේ කා හට ද?
(iii) "මුළුල්ල ම සපයාලා 'එන්න, යමිත'යි කිවුය" මෙය ලිඛිත් බසින් ලියන්න.
(iv) 'ලදපස්මල්' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

පිළිතුරු

i. දෙවියන්ට පිදේනියක් (පූජාවක්) දෙන්නට නැති නිසා

ii. රා බී ඇවිදිනවුනට

iii. අවශ්‍ය/ වුවමනා සියලු දේ සුදානම් කර/සම්පාදනය කර එන්න, යමු යයි කිවා ය.

iv. සමන් කැකුළු (මල්), හෙළ/සුදු අඹ, සුනු සහල්, ඊතණ, විලඳ

(හතරක් තිබුණොත් ලකුණු දෙන්න.)

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(ආ) මෙසේමෙසේ නොයෙක් ප්‍රකාරයෙන් එක කුඹුරෙහි වී වියදම් කොට ඉසිරි දෙයක් ගෙනවුත් කොටුවෙක පටවාගෙන සිප්වටයයි එක් භාගයක් තබාගනමැනව; ඇස් යයි එක් භාගයක් වෙන් කොට සිප්වටභාගය නොකා ඇස්භාගය කැවමැනව. එසේ තන කල පමණ නොදැන නොකා අදට මෙතෙක් ගතමැනව. පෙරට මෙතෙක් ගතමැනවැයි පමණ දැන කැවමැනව. මතු මෙතෙක් දවස් ගියකල ගොයම් පැසෙයි. එවක දක්වා රැකුණ මනා වේ දැයි සිතසිතා සුසික්සුග කැවමැනව. මෙසේ ඒත් සමයෙක දුක්ගෙන උපායක් කල අනික් සමයෙහිත් පෙර නොකලා සේ ම මෙසේ වීර්ය කළමනාය. මෙසේ දිවිහිමියෙන් ම යලක් හිසක් අනුමාදැව ගමන කල මැනව. පරීක්ෂා කළ කල නොවිනු නියම් හිඳිනා දවසෙක් නම් නැත. ලෙඩව හොත් කලත් උපයා කෑ නොහැක්ක. සේවාකම් ආදී වූ නොයෙක් කටයුත්තෙහි නියුක්තව ගිය කලත් ගම හිඳ උපයා කෑම නම් නැත් මය. මහලුව ජරාවට පැමිණි කලත් මෙකී කර්මාන්ත කොටගත නොහැකි හෙයින් උපයා කෑ නොහැක්ක.

(i) මේ ඡේදයෙහි දැක්වෙන පරිදි ගොවින්ට උපයා කෑ නො හැකි අවස්ථා කීයක් තිබේ ද?
(ii) කෑම සඳහා වෙන් කෙරෙන වීවලට මෙහි යොදා ඇති වචනය කුමක් ද?
(iii) "කොටුවෙක පටවාගෙන සිප්වටයයි එක් භාගයක් තබාගනමැනව" මෙය ලිඛිත් බසින් ලියන්න.
(iv) 'දිවිහිමියෙන්' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

i. අවස්ථා තුනකි.

ii. ඇස් භාගය

iii. වී බිස්සක/කෝෂ්ටයක/කෝෂ්ටාගාරයක/අටුවක දමාගෙන බිජුවට/බිත්තර වී ලෙස එක කොටසක් තබා ගැනීම සුදුසුයි.

iv. දිවි ඇති තෙක්/ජීවිතාන්තය දක්වා / ජීවිතය ඇති තුරා

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(ඩ) සු ර ග න රඟ රඟ න එවෝ
රි දි ද න මින තෙත් වෙ එවෝ
මිනසොන සර කුසුම් එවෝ
තැන තැන රඟ දෙයි න එවෝ

රැගත් සුරා පිරූ වි සින්
සුරත් තඹුරු පෙතිසෙ නෙ තින්
පුවත් නොදැන මිමින ග සින්
නටත් අගයෙන් සුරා ම සින්

(i) සුරාවෙන් මත්වූවන් නැටූයේ කවර ආකාරයෙන් ද?
(ii) සුරඟනන්ගේ නෘත්‍ය විලාසය තරජ්ය කළේ කවරහු ද?
(iii) මෙහි ඇති උපමාව උපුටා දක්වන්න.
(iv) 'මිනසොන' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. රතු පාට නෙලුම් පෙති වන් ඇස් අති ව වැනෙන/කැරකෙන ශරීරයෙන්

ii. නළුවෝ

iii. සුරත් තඹුරු පෙති සෙ (නෙතින්)

iv. අනංගයා, මල්සරා, කුසුමාසන, අනඟ (ආදි අනංගයා හැඳින්වීමට ඇති වෙනත් පද ද පිළිගන්න.)

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

● (උ) සහ (ඌ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **සතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "අක්කා මට දැන් හිරයක් ගෙන්ව කාලෙ නොදා"
(ii) "ලොවී සුවයක පිහිටලා නැති
ලොව්තුරා ආස්වාදයෙන් කිම?"
(iii) "උඹ වෙබිල එක්ක පෙල්ලම් නෙරුව ද?"
(iv) "පළමුව දූවූ නෙනතුන් නෙලෙ හැරගන්නේය"
(v) "හැමතැනදී ම පිරිමින් උපදෙස් දනිති නැත. සමහර තැනක ගෑණු ද උපදෙස් දනිති."
(vi) "අපගේ දේවියෝ උතුනී වූහ. දරු උපතක් සිවිනා සැටි ය."
(vii) "ගින්නෝර මල් බඳු ඇස් ඇති මනා වූ භාවනාව ලීලා විලාස ඇති චන්ද්‍රිකාව තෝ සෝක නො කරව"
(ලකුණු 03 x 4 = 12 යි.)

(i) ලෙනාඩ් වුල්ෆ් විසින් ලියන ලද බැද්දේගම නවකථාවෙන් උපුටා ගත් පාඨයකි.
පුංචි මැණිකා විවාහ කර ගැනීමේ අදහසින් පසු වන බබුන් ඇ හමු වීමෙන් අනතුරු ව සිය සහෝදරිය වන නැන්චොහාමී හෙවත් ආරච්චි බිරිඳට කරන ප්‍රකාශයකි.

(ii) එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචනා කරන ලද ප්‍රේමතෝ ජායති සෝකෝ නාට්‍යයෙන් උපුටා ගත් පාඨයක් වන මෙය උද්දාල බමුණා ස්වර්ණතිලකා විවාහ කර ගැනීමේ අරමුණින් ක්‍රියා කරන අවස්ථාවේ ඇයට කරන ලද ප්‍රකාශයකි.

(iii) ඒ.වී. සුරවීර විසින් රචනා කරන ලද අකුරට යන වේලාවේ කෙටිකතාවේ, නිවසේ කටයුතුවලට සහාය වීමට රැගෙන ආ දැරිය (මැණිකා) රාත්‍රී කෑම මේසය අසලට කැඳවූ අවස්ථාවේ මිසිස් කරුණාපාල ඇයගෙන් අසන පැනයකි.

(ඉ) පඤ්චායුධයෙන් සන්නද්ධ ව හිමාල වනයට වැද මුවන් මරා කා ඇවිදිනේ සුළු හොයකට පැමිණ හොය උඩ පාත මුව හසර බලා ඇවිදිනේය. එහි රිදී පටුනි වසන්නා වූ සඳ කිඳුරෝ ද වැසි සාර මස පර්වතයෙන් නොබැස ගිම් සාරමස ඒ පර්වත පාදයෙහි ඇවිදිති. ඒ කැලයට යට කියන ලද සඳකිඳුරු රජ්ජුරුවෝ තමන්ගේ කිඳුරාංගනාව හා සමග පර්වතයෙන් බැස ඒ ඒ ස්ථානයෙහි සුවඳ මල් කඩා හා විලවුන් ගන්නාහුය. තව ද මල් පට හඳනා වූ පොරෝනා වූ ලිය හොවිල්ලෙහි කෙළනා වූ මිහිරි ස්වරයෙන් ගී කියන්නාහු යට කියන ලද්දා වූ හොයට පැමිණ ඒ හොය වංකස ගොඩ ව තුඹු වැල්ලකට බැස දියවල මල් කඩා දමා දියකෙළි නැවත මල්පට හැද පෙරව රිදීපටක් බඳු වූ වැලි තෙලෙහි මල් හසුන් පනවා එක් **වස් කුලලක්** පිඹිමින් ගී කිය කියා කුසුමාසන මස්තකයෙහි උන් කල්හි කින්නරාංගනා එහරි මල්දම් බඳු වූ මොලොක් අත් නැමීමෙන් නැටීමෙන් හෙළිමෙන් තුදුරු නැත්ති සිට ගී කිය කියා විසිතුරු නැටීමක් නටන්ට පටන් ගත්හ.

(i) සඳකිඳුරන් පර්වත පාමුල ඇවිදින්නේ කුමන කාලයේ ද?
(ii) කිඳුරන් මල් ආසන සකස් කරන්නේ කුමන ස්ථානයක ද?
(iii) "සුළු හොයකට පැමිණ හොය උඩ පාත මුව හසර බලා ඇවිදිනේය" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**වස් කුලලක්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. ගිම් සාර මස/ ග්‍රීෂ්ම ඍතුවෙහි මාස හතර

ii. වැලි තලාවෙහි/ සුදු වැලි තලාවෙහි / රිදී පටක් බඳු වැලි තලාවෙහි.

iii. කුඩා ඔයක් ළඟට පැමිණ ඔයේ උඩ පාත (ඉහළ/පහළ) මුවන්ගේ සංචාරය/මුවන්ගේ පා සලකුණු/ පා හසර බලා ඇවිදින්නේ ය.

iv. බට නළාවක්. / වස් දුක්ඛයක්

(ලකුණු 1x 4 = ලකුණු 4 යි.)

(ට) එකල නන්දිය වෙළෙඳාණන්ගේ භාර්යාවෝ උත්සව බලනු සඳහා ඉස්සෝධා නහා **සර්වාභරණයෙන්** සැරහී දාසිසමූහයා පිරිවරා එක් දාසියක ඇඟ එල්බ ගෙන ශරීරභාගයක් පෙනෙන සේ මතු මහල් තෙලෙහි උත්සව බල බලා සිටියහ. එකල්හි අමාත්‍යයා දෙපස වීථිවින්‍යාස සැරහීම් බල බලා සතුටු සතුටු ව යනුයේ උඩුමහල් තෙලෙහි සිට වීථිය දසාව බැලූ වෙළෙඳ භාර්යාව දැක උන්ගේ රූප නමැති සුරාපානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ඡා ව භ්‍රාන්ත ව ගිය සිත් ඇති ව තද හියකින් විත් කෑ මුවකු සේ වෙළෙඳ භාර්යාවන්ගේ මදලස බැලුම් නමැති ශරප්‍රහාරයෙන් මූර්ඡා ව දැසින් වැහෙන කඳුළු ධාරා නමැති රුධිරයෙන් රැඳී විරූපභාවයට පැමිණියාවූ මුහුණු ඇති ව අඩ අඩා පෙරළෙමින් තමා හා එක් ව යන්නවුන් මණවා "එම්බා නැයෙනි, යහළුවෙනි, මිත්‍රයෙනි, තෙල උඩුමාලේ දෙවඟනක සේ සිටිනෝ කවුරු ද, කාගේ දියණියකෙනෙක් දැ"යි විචාළේය.

(i) වෙළෙඳ භාර්යාව දැකීමෙන් විපර්යාසයට පත්වූ අමාත්‍යයා හැඳින්වීමට යොදාගත් උපමාව කුමක් ද?
(ii) නන්දිය වෙළෙඳ භාර්යාව සිරුරෙන් අඩක් දක්නා සේ සිටිමින් උත්සව නැරඹුවේ කවර ස්ථානයක දී ද?
(iii) "රූප නමැති සුරාපානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ඡා ව භ්‍රාන්ත ව ගිය සිත් ඇති ව" මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**සර්වාභරණයෙන්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

i. තද හියකින් විත් කෑ මුවකු සේ / තද ඊතලයකින් පහර කෑ මුවකු සේ.

ii. උඩු මහල් තලයෙහි/ මතු මහල් තලයෙහි/ මතු මාලෙහි. / උඩ තට්ටුව

iii. රූපය නැමැති සුරාව පානය කිරීම/ බීම නිසා උන්මත්තක ව/සිහි විකල් ව /පිස්සු වැටී ගිය පරිද්දෙන් මූසපත් ව/ක්ලාන්ත ව /සිහි මුළාවට පත් ව, බියට පත් ව/තැති ගෙන

iv. සියලු ආභරණවලින්/හැම ආභරණයකින්ම

(ලකුණු 1x 4 = ලකුණු 4

(ආ) භාෂා භාවිතයෙහි සහ වස්තු විෂයෙහි මව දකින විශේෂතා පැහැදිලි කරමින් පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි සාහිත්‍යමය අගය විමසන්න.

දෙවියන් මැරීම

බුද්ධිය මිත්‍රයෙකැයි සිතූ මම
දිනක් මග රැක සිට,
මගේ දෙවියන්
මරා හෙළිමි.
ඇවැත්සෙකු වන බුද්ධිය
අඳුරෙහි මහ අඩි තබමින්
මා පිටුපසින් එනු
මට ඇසෙයි.

එහෙත් දෙවියන් සිටි කල මෙන්
දැන් මට
සැක හැර ගමන් කළ නොහැක.
මා වැටුණු කල
දැන් දෙවියන් නැති හෙයින්
මා ම
නැඟී සිටිය යුතු ය.

යළිත් දෙවියන් සොයා ගිය මට
උන්වහන්සේගේ රත්වත් මළ සිරුර
මග අසල
තණ පස යට තිබී හමු විය.

"ස්වාමීනි, යළිත් නැඟී සිට
මා හා පෙර මෙන්
එනු මැනව" යි මම කීමි.

උන්වහන්සේ
නැඟී නො සිටින්නේ
බුද්ධිය
තම දත් දෙපෙළ පෙන්නා
විළිස්සමින්
මා පිටුපස සිටින හෙයින් බව
මම දනිමි.

එහෙත් මට බුද්ධිය ගසා පලවා හැරිය නොහැක.
ඔහු මා අත්හැර නොයයි. (ලකුණු 12 යි.)

මෙම පද්‍ය නිර්මාණයට වස්තු විෂය වන්නේ බුද්ධිය හා සාම්ප්‍රදායික විශ්වාස නැත හොත් භක්තිය අතර ඇති ගැටුම යි. බුද්ධියෙන් මුහුකුරා යන මිනිසා සාම්ප්‍රදායික විශ්වාස තම ජීවිතයට නුවුමනා දෙයකැයි සිතා පසෙක ලයි. බුද්ධියේ බල මහිමයෙන් සියල්ල සාක්ෂාත් වෙතැයි අපේක්ෂා කරයි. එහෙත් උපවිඥානය තුළ තැන්පත් ව ඇති සාම්ප්‍රදායික මතිමතාන්තර විටෙක ඔහුගේ දිරිය සිඳ බිඳ දමයි. එසේ වුව ද බුද්ධියට පිටු පා ආපසු යන්නට හැකියාවක් ඔහුට නැත.

මෙම අන්තර්ගතය සඳහා කවියා යොදා ගන්නා වස්තු විෂය සමකාලීන කාව්‍ය නිර්මාණ අතර සුවිශේෂතාවක් හිමි කර ගනී. එය නිදහස් කවියට ආවේණික සියුම් හා සංකීර්ණ භාවමය අත්දැකීමකි. අපූර්වත්වයෙන් එය ඉදිරිපත් කරන්නට කවියා සමත් වේ. ජී.බී. සේනානායක සමකාලීන සමාජ තත්ත්ව නිරූපණයට වැඩි වශයෙන් නැඹුරු නො වූවකු බවට මෙය ද සාධකයක් වේ.

භාෂාව : මෙම නිර්මාණය සඳහා කවියා යොදා ගන්නා භාෂාවෙහි කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

* සරල හා වියත් බස සංකලනයෙන් අත්දැකීමට උචිත බස් වහරක් සමස්ත කාව්‍ය නිර්මාණයට යොදා ගැනීම.

* රූපකාර්ථවත් භාෂා ව්‍යවහාරයක් උපයෝගි කර ගැනීම. එය කාව්‍යයේ සංක්ෂිප්ත භාවයට ද ඉවහල් වේ.

උදා - "එහෙත් මට බුද්ධිය ගසා පලවා හැරිය නොහැක.
ඔහු මා අත හැර නොයයි."

* ව්‍යංග්‍යාර්ථවත් භාවය හා ඇතැම් අවස්ථා වර්ණනයට සුදුසු පරිදි බස් වහර යොදා ගැනීම.

උදා - "දැවැන්තයකු වන බුද්ධිය
අඳුරෙහි මහ අඩි තබමින්
මා පිටිපසින් එනු
මට ඇසෙයි."

* සංවාදාත්මක හා ආඛ්‍යානමය ස්වරූපයක් ගැනීම

"ස්වාමිනි, යළිත් නැඟී සිට
මා හා පෙර මෙන්
එනු මැනව' යි මම කීමි."

මීට අමතර ව පහත දැක්වෙන කරුණු පිළිබඳ ව ද අවධානය යොමු කිරීම සුදුසු වේ.

* ආකෘතිය

කවියා අන්තර්ගතයට ගැළපෙන ආකෘතියක් නිර්මාණය කර තිබේ. එය නිදහස් ආකෘතිය යි. සියුම් මනෝභාවයන් ප්‍රතිනිර්මාණයට එය උචිත ය. පද සංඝටනය අර්ථ මාධුර්යයක් ජනිත කරයි.

උදා - "මා ම
නැඟී සිටිය යුතු ය."

* සංකල්ප රූප මැවීම.

උදා - "උන්වහන්සේගේ රන්වන් මළ සිරුර
මහ අසල
නුග ගස යට තිබී සම්බ විය."

සාහිත්‍යමය අගය විමසීමේ දී මෙවන් කරුණු පිළිතුරට ඇතුළත් වීම ඉහළ ලකුණක් ප්‍රදානය කිරීමට ඉවහල් වේ.

(ලකුණු |



CS CamScanner

(ආ) උපමා භාවිතයෙහි ලා සද්ධර්මරත්නාවලි කතුවරයා දැක්වූ දක්ෂතාව නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

සද්ධර්මරත්නාවලි කතුවරයා නිර්දිෂ්ට කථා දෙකේ දී ම උපමා භාවිත කොට ඇති ආකාරය පිළිබඳ විමසීමක් මෙයින් අපේක්ෂා කෙරේ.

**සද්ධර්මරත්නාවලියෙහි උපමා භාවිතය**

**මට්ටකුණ්ඩලී වස්තුව**

**ජන විඥානයෙන් යොදා ගත් උපමා**

උදා - ආඳා යවා තබලා වලපත ගත්තා සේ
පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ
ඇස් සරහන්නට තොල අඳුන් ගානා සේ
පොල් ගසකින් තල් පත් පතන්නා සේ

**සාහිත්‍යමය / කවි සමයෙන් ගත් උපමා**

ලා රසෙහි ගලා ඔසවා ගත් කොබෝලීල මල්දමක් වැනි
බඳු වදමල් ඇතිරියක් වැනි
පුන් සඳ රත් වලායෙකින් වසන්නාක්හු මෙන්

**කුණ්ඩලකේසී වස්තුවේ උපමා**

රූපවත් ව උපන්නාට පාටෝපයට සිර ගෙයක ලූවා සේ
අසුරන් වැද ගිය දිව්‍යපුරයක් මෙන්
මරණ දුකින් ගැලවුනා සේ සසර දුකින් ගැලවුනාහු ය.

* උපමා හතරක් වත් යොදා ගනිමින් උචිත නිදසුන් පාඨ සහිතව නියමිත කතා වස්තු ඇසුරින් පිළිතුරු ලියා තිබීම අපේක්ෂා කෙරේ. (ලකුණු 08 යි.)

**නැත හොත්**

"විවිධ මානවචර්යාවන්හි දක්නට ලැබෙන විෂම ස්වභාවය ජාතක කථා මඟින් තාත්ත්වික ව නිරූපණය වේ." නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

විවිධ මානවචර්යාවන්හි දක්නට ලැබෙන විෂම ස්වභාවය ජාතක කථා මඟින් තාත්ත්වික ව නිරූපණය ඇති ආකාරය නිර්දිෂ්ට කථා දෙකෙන් ම නිදසුන් දක්වා තිබීම අපේක්ෂිත යි.

චන්ද කින්නර ජාතකය හා චූල්ල ධනුද්ධර ජාතකය ඇසුරින්

* මානව චර්යාවන්හි විෂම ස්වභාවය

  බ්‍රහ්මදත්ත රජු ස්වාමියා (කිඳුරා) මරා දමා විවාහක කාන්තාව ලබා ගැනීමට තැත් දැරීම (චන්ද කින්නර ජාතකය)

  සස්වාමික කාන්තාවගේ සිතෙහි මතු වන ක්ෂණික තීරණ නිසා ස්වාමියා හැර වැද්දා අත

  කඩුව දීම. (චූල්ල ධනුද්ධර ජාතකය)

* මීට අමතර ව ප්‍රශ්නයට ගැළපෙන සේ මානව චර්යාවන්හි විෂම ස්වභාවය තහවුරු කිරීම සඳ කරුණු දක්වා ඇති නම් ලකුණු ප්‍රදානය කිරීම සුදුසු යි.

  (සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.) (ලකුණු 0

මුළු ලකුණු



CamScanner

2. පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(අ) දඹදෙණි-කුරුණෑගල අවධීන්හි පාලි භාෂාවෙන් සිංහලයට පරිවර්තනය වූ ගද්‍ය කෘති පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 07 යි.)

(අ) දඹදෙණි - කුරුණෑගල අවධීන්හි පාලි මූලාශ්‍රය ආශ්‍රයෙන් සිංහලයට පරිවර්තනය වූ ගද්‍ය කෘති පිළිබඳ ව ප්‍රමාණවත් හැඳින්වීමක් සිදු කිරීම අපේක්ෂිත යි.

සද්ධර්මරත්නාවලිය ධර්මසේන හිමි දඹදෙණි අවධියේ දී පාලි ධම්මපදට්ඨ කථාව පදනම් කර ගෙන රචනා කර ඇත.

සද්ධර්මරත්නාවලිය පිළිබඳ හැඳින්වීම.

* අරමුණ - "යම් කෙනෙක් නුවණ මඳවත්... බණ දැන පින්කමැ හැසිර නිවන් සාධා ගනිත් නම්... "
* විශේෂ ලක්ෂණ
  - මෙය පදානුගත පරිවර්තනයක් නො ව මූලාශ්‍රයේ ඇසුර ලබා කළ ස්වාධීන නිර්මාණයක් වීම.
    උදා - "පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන කළා වූ අප ප්‍රබන්ධයෙහි" යන්නෙන් එය සනාථ වේ.
  - කරුණු පැහැදිලි කිරීමේ දී උපමා පිරුළු භාවිතය සහ පොදු ජන වහර යොදා ගැනීම.

දඹදෙණි යුගයේ පාලි මූලාශ්‍රය ආශ්‍රයෙන් රචනා වී ඇති වෙනත් කෘති

විශුද්ධි මාර්ග මහා සන්නය,

කුරුණෑගල අවධිය (ක්‍රි.ව. 1293 - 1347)

පන්සිය පනස් ජාතක කතා පොත - පාලි ජාතකට්ඨකථා පදනම් කරගෙන ලියවිණ.

බහුකර්තෘක කෘතියකි

සම්භාව්‍ය සාහිත්‍යයේ අග්‍රගණ්‍ය ගද්‍ය කෘතිය බව, ප්‍රමාණයෙන් විශාලතම කෘතිය බව, පාලි ජාතකට්ඨකථාවේ සිංහල පරිවර්තනයක් බව

ජාතක කථාවේ පොදු ලක්ෂණ

- ආකෘතිය - වර්තමාන, අතීත, සමෝධානය.
- ශ්‍රැති ගෝචර භාෂා රටාවකින් යුක්ත බව.
- උගත් නූගත් සැමට පොදු බව.
- සර්ව කාලීන අගයකින් යුක්ත බව.
- ජීවිතයට සදුපදේශ ලබා දෙන බව.

කුරුණෑගල අවධියෙහි පාලි මූලාශ්‍රය ආශ්‍රයෙන් රචිත වෙනත් කෘති

ථූප වංසය- විද්‍යාචක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත

සිංහල බෝධි වංසය - විල්ගම්මුල සංඝරාජ හිමි

අනාගත වංසය - විල්ගම්මුල සංඝරාජ හිමි

දඹදෙණි හා කුරුණෑගල අවධිවල පාලි භාෂාවෙන් සිංහලයට පරිවර්තනය වූ ගද්‍ය කෘති දෙකක් ඇසුරින් කරුණු පැහැදිලි කිරීම ප්‍රමාණවත් වේ. (ලකුණු 07 යි)

3. "සරල භාෂා ව්‍යවහාරය මෙන් ම වර්ණනාත්මක භාෂා ව්‍යවහාරය ද යොදා ගැනීම හේතුවෙන් සද්ධර්මාලංකාරයේ කථා වස්තුවල රසවත්භාවය තීව්‍ර වී ඇත" නිර්දිෂ්ට කථා වස්තු ආශ්‍රයෙන් මේ ප්‍රකාශය විමර්ශනය කරන්න.

මෙහි දී සරල හා වර්ණනාත්මක භාෂා ව්‍යවහාරය නිදසුන් මගින් දක්වා තිබීම සහ ඒවා අවස්ථානුකූල ව කථා වස්තුව රසවත් වීමට හේතු වන ආකාරය දක්වා තිබීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

* සරල භාෂා ව්‍යවහාරය - ස්වර්ණතිලකා වස්තුව

උදා : "ඒ කුමාරිකාවන්ගේ මැණියෝ තමන් දියණියන් මල් අස්නන ශුද්ධ නො කොට මල් පිදූ බව දැක..."

නන්දි වාණිජ වස්තුව

උදා - "සබඳිනි, දැන් ඒ වෙළෙඳාණෝ කොහි දැ' යි ..."

වර්ණනාත්මක භාෂා ව්‍යවහාරය - ස්වර්ණතිලකා වස්තුව

උදා - "ඔප් නැංවූ රන් කැටපතක් මෙන් බබළන්නාවූ ස්ත්‍රීන්ගේ මුහුණ දැල බැඳුණු මසුන් මෙන් චලිත ව ..."

නන්දි වාණිජ වස්තුව

උදා - "භාර්යාවන්ගේ මදලස බැලුම් නමැති ශර ප්‍රහාරයෙන් මූර්ච්ඡා ව ..."

සරල සහ වර්ණනාත්මක භාෂා ව්‍යවහාරය ඒ ඒ කථාවස්තුවල රසවත් බව තීව්‍ර කිරීම සඳහා උපකාරී වී ඇති ආකාරය තවත් මෙවැනි නිදසුන්වලින් දක්වා තිබීම ප්‍රමාණවත් ලකුණු ලබා දීම සඳහා සෑහේ. (ලකුණු 15)

**නැත හොත්**

"කථා ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ දී ශ්‍රාවක අවධානය යොමු කර ගැනීම සඳහා අභව්‍ය සිද්ධීන් යොදා ගැනීම පූජාවලි කතුවරයා භාවිත කළ උපක්‍රමයකි." නිර්දිෂ්ට කථා ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

මෙහි දී කථා ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ දී ශ්‍රාවක අවධානය යොමු කර ගැනීමට අභව්‍ය සිද්ධීන් යොදා ගැනීම පූජාවලියේ කතුවරයා භාවිත කළ උපක්‍රමයක් බව පිළිතුරෙන් පෙන්වා දී තිබිය යුතු ය.

අනුරුද්ධ කුමාර කථාව : දෙවියන් කැවුම් මවා දීම.

උදා - "මාගේ අනුරුද්ධ කුමාරයෝ මවුකුසින් උපන්දා පටන් නැතැ'යි යන බසෙහි අර්ථ නොදත්තාහු ය; එබසෙහි අර්ථ දැනපු නම් උන්ගේ පින් බලයෙන් මා ඉස සත්කඩක් ව පැළී යයි..."

ජීවක වෛද්‍යවරයාගේ කථාව : ශක්‍රයා ආචාර්යවරයාගේ මුඛයට ආරූඪ වී ශිල්ප ලබා දීම.

උදා : "මාගේ බුදුන්ට මතු පිළියම් කරන වෙදහුට මම ආචාරි වෙමි'යි..."

රජතුමා ගෝනුස්සකුට අව පිළිසිඳ ගැනීම.

"රජහව පළමු මම මැ හා ආස්වාදයක් කෙරෙමි'යි යානව නැගී බිසොවුන් නාභියෙහි පරාමර්ශනය කෙළේ ය"...

මේ හා සමාන අභව්‍ය සිදුවීම් ඇතුළත් ප්‍රකාශන ද දක්වමින් ඒවා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කොට තිබේ නම් සුදුසු පරිදි ලකුණු ලබා දිය හැකි ය.

(සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 15 යි.)

4. අවස්ථා නිරූපණයේ දී වැත්තෑවේ හිමියන් දැක්වූ සාමර්ථ්‍යය සුරතහ රැඟුම ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 15 යි.)

අවස්ථා නිරූපණයේ දී වැත්තෑවේ හිමියන්ගේ සාමර්ථ්‍යය සුරතහ රැඟුම ඇසුරින් පැහැදිලි කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

අවස්ථා වර්ණනයේ දී කතුවරයා පළමු කොට නළහනන්ගේ නැටුම ආරම්භ කළ ආකාරය ඉදිරිපත් කිරීම.

උදා - "ළඟ ළඟවා උනුනට කර වාදය ..."

අනතුරු ව නටන ආකාරයෙන් එහි ඇති චිත්තාකර්ෂණීය ස්වභාවයක් ඉදිරිපත් කරයි. මෙහි දී විරිත් භාවිතය ඇසුරින් නැටුමේ ලාස්‍ය ස්වරූපයත් නිරූපණය කොට ඇත.

උදා - "රූ රැසේ අඳිනා ලෙසේ ..."

නළහනන්ගේ ස්වරූපය උපමා මඟින් අලංකාරවත් කිරීම

උදා - "පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුන් මන් මෙන් බැඳේ..."

ශරීර අවයව සරසා ගත් ආකාරය

උදා - "පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා..."

කාව්‍ය වෘත්ත සහ රිද්මයේ වෙනස් වීම මඟින් නැටුමේ ලය මානය විවිධ ස්වරූප දැක්වීම. නැටුමේ ආරම්භය, මධ්‍යය හා අවසානය තෝරා ගත් විරිත් හා රිද්ම මඟින් ඉදිරිපත් කිරීම නැටුමට සැරහී පැමිණීම, නැටුම ආරම්භය උච්ච අවස්ථාව යන තුනට මෙවැනි උදාහරණ දක්වමින් විස්තර කර තිබීම ලකුණු ලබා දීමේ දී සැලකිල්ලට ලක් කිරීම සුදුසු ය.

(ලකුණු 15

**5. බැද්දේගම නවකථාවෙන් ප්‍රකට වන්නේ "යටත් විජිත පාලනයෙන් පීඩාවට පත් වන ගැමියන්ගේ ඛේදවාචකය යි", නිදර්ශන ඇසුරෙන් සාකච්ඡා කරන්න.** (ලකුණු 15 යි.)

යටත් විජිත පාලනයෙන් පීඩාවට පත් වන ගැමියන්ගේ ඛේදවාචකය බැද්දේගම නව කථාවෙන් ප්‍රකට වන ආකාරය සාකච්ඡා කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහි දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

❖ ඉංග්‍රීසි ආණ්ඩුව මගින් ජනතාවට නො ව බ්‍රිතාන්‍ය රජයට වග කියන පරිපාලන ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීම

එහි නිලධාරීන්ගෙන් රජයට මිස පොදු ජනයාට ඉටු කෙරෙන සේවයක් පෙනෙන්නට නැත. බදු එකතු කිරීම, තමන්ට රිසි සේ නීතිය ක්‍රියාත්මක කිරීම, නිල බලය යොදා ගනිමින් පෞද්ගලික පලිගැනීම් සිදු කිරීම ආදිය ඔවුන්ගෙන් සිදු වන ගැහැට ලෙස දැක්විය හැකි ය.

උදා : "රාළහාමි , මං දුප්පත් මිනිහෙක්. සිලිම් හතරක් තියා තුනක්වත් ගෙවන්නෙ මොනවයින් ද?.."
"ලැයිසොමක් ගන්ඩ ඕනෑ. ඒකයි ආණ්ඩුවෙ නීතිය"
"මේ අතර බබෙහාමිත් ප්‍රනාන්දුත් නිකම් සිටියේ නො වේ. කපටි මුලාදෑනියාත් කුට උපාය දත් නාගරිකයාත් එකතු වූ විට බලවත් යෝගයකි. රාත්‍රියේ බබෙහාමිගේ ගේ බිද බඩු ගෙන තිබෙන බවත් ....."

❖ පරිපාලනයේ දී ඉංග්‍රීසි භාෂාව යොදා ගැනීම

මේ නිසා අධිකරණ ක්‍රියාදාමය තුළ සිදු වන කිසිවක් සාමාන්‍ය ජනයාට නො තේරේ.

උදා : "සිලිඳු වෙනුවෙන් නියම කළ මරණීය දණ්ඩනය වෙනස් කර ඒ වෙනුවට විසි අවුරුද්දක් බරපතල වැඩ ඇති ව බන්ධනාගාරයට නියම කළ බව ඒ ලියවිල්ලෙන් කියවුණේ ය.
උඹට තේරුණා ද යෝද්දයෝ ? යි දෙවැන්නා ඇසී ය.
මට තේරුණේ නෑ හාමුදුරුවනේ."

❖ ජනයාගේ ආර්ථික තත්ත්වය හෝ සෞඛ්‍ය තත්ත්වය හෝ නගා සිටුවීමට නිසි වැඩ පිළිවෙළක් රජය මගින් ක්‍රියාත්මක නො කිරීම

එනිසා බැද්දේගම ජනයා සදාකාලික ණය චක්‍රයක සිර වී සිටින අතර සාගත හා වසංගතවලට ගොදුරු වෙමින් ක්‍රමයෙන් විනාශය කරා යන ආකාරය මෙමගින් නිරූපණය කෙරේ.

උදා : "ඉපදී වැඩි දවසක් යන්නට පෙර ආරා ගිය කහ පාට බඩ ගෙඩි ඇති ව උණෙන් ඉදිමී උදර රෝගයෙන් පිපිහළ වී ගිය ...කුඩා දරුවෝ නිරුවතින් හැසිරෙති."
" නැන්චො හාමි මේ ඇල්ලුවේ ගම්මුන්ගේ ජීවිතය නැමති ඔරලෝසුව වැඩ කරන මහ දුන්නම ය. ගම්මු ජීවත් වූයේ ණය ගැනුමෙනි."

මීට අමතර ව වෙනත් උචිත කරුණු ද නිදසුන් මගින් දක්වා තිබිය හැකි ය.

(ලකුණු 15)

**6. සාර්ථක කෙටි කතාවක අන්තර්ගත විය යුතු කලාත්මක ලක්ෂණ මොනවා දැයි කරත්තය කෙටි කතාව ආශ්‍රයෙන් විමසන්න.** **(ලකුණු 15 යි.)**

සාර්ථක කෙටි කතාවක අන්තර්ගත විය යුතු කලාත්මක ලක්ෂණ කරත්තය කෙටි කතාව ඇසුරින් සලකා බැලීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

කෙටි කතාවක අඩංගු විය යුතු කලාත්මක ලක්ෂණ ලෙස කථා ප්‍රවෘත්තිය, කථා වින්‍යාසය, චරිත නිරූපණය, අවස්ථා හා සිද්ධි නිරූපණය, පසුබිම් නිරූපණය, දෘෂ්ටි කෝණය, නිර්මාණාත්මක භාෂා භාවිතය හා ජීවන දෘෂ්ටිය යනාදිය දැක්විය හැකි ය.

කථා වින්‍යාසය

මෙම කෙටිකතාව මුල මැද අග සහිත සාම්ප්‍රදායික කථා ප්‍රවෘත්තිය පදනම් කර ගත් කතා ක්‍රම වෙනුවට නවතම ආකාරයකට ගොඩනගා ඇති බවක් දක්නට ලැබේ. එයින් ප්‍රකට වන්නේ නාට්‍යමය ආකෘතික ලක්ෂණයකි.

උදා: නම : රණසිංහ

වයස: 44

රස්සාව : කරත්ත රස්සාව

1980 ගණන්වල සිදු වූ රාජ්‍ය විරෝධී කැරලි පසුබිම් කර ගනිමින් ලියැවුණු මෙම කෙටි කතාව මගින් ග්‍රාමීය පෙදෙස්වල ද රාජ්‍ය ආයතන තුළ ද ක්‍රියාත්මක වූ මර්දනකාරී ස්වරූපය මැනවින් නිරූපණය වේ. ඊට අදාළ භෞතික පරිසරය ද චරිත හා සිදු වීම් ද ආශ්‍රයෙන් කෙටි කතාවේ පසුබිම නිරූපණය කර තිබේ.

චරිත නිරූපණය

කරත්තකරුවාගේ චරිතය යථාර්ථවත් ලෙසත් අපූර්ව ලෙසත් නිර්මාණය කර තිබේ.

උදා: " මට ගෙදරක් නෑ - දවස් හත ගෙවෙන්නෙ හත් පොළක - ..."

"...කඳු, වැස්ස, අව්ව මගේ විෂය ලෝකයයි. ගොනා බල්ලා මගේ මිතුරෝ ය."

අවස්ථා හා සිද්ධි නිරූපණය

කතාවට නො ව අවස්ථා, සිද්ධි නිරූපණයට ප්‍රමුඛත්වයක් ලැබෙන මෙම කෙටි කතාවේ එම අවස්ථා, සිද්ධි තුළ කුතුහලය, දයානුකම්පාව මෙන් ම ත්‍රාසය හා උත්ප්‍රාසය ද ගැබ් ව තිබේ.

උදා : " මොහොතක් බලා සිට ආවේශ වූ කලක මෙන් නැගී සිටි රාළහාමි දැතින් ඔහුගේ හිසකේ අල්ලා කිහිප වරක් සොලවා ඔහු සිටෙව්වේ ය..."

සජීව හා උත්ප්‍රාසවත් සංවාද භාවිතය

උදා : "තමා ඒ කාලයේ ඔච්චර ඉගෙනගෙන ඇයි රස්සාවකට නොගියේ ?"

"ඇයි මම රස්සාවක් කරනවා."

"මම අහන්නේ උගත්කමට ගැළපෙන රස්සාවක්?"

"එහෙම එකක් තියෙනව ද ?"

මීට අමතර ව ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණය හා ජීවන දෘෂ්ටිය පිළිබඳ ව ද අවධානය යොමු කිරීම සුදුසු ය

මෙවැනි කරුණු තුනක් වත් නිදසුන් සහිත ව පිළිතුර තුළ අන්තර්ගත වීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 15)



CamScanner

**7. හෙළ හවුලට අයත් කවීන්ගේ පද්‍ය රචනාවන්හි පවත්නා විශේෂත්වය නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ ඇසුරින් පහදන්න. (ලකුණු 15 යි.)**

හෙළ හවුලට අයත් කවීන්ගේ පද්‍ය රචනාවන්හි විශේෂත්වය නිර්දිෂ්ට පද්‍ය ඇසුරෙන් පැහැදිලි කර තිබීම මෙහි දී අපේක්ෂා කෙරේ.

මෙම පිළිතුර ලිවීම සඳහා යොදා ගත යුත්තේ නැළවිල්ල, කුකුළු හැවිල්ල හා මඟුල් ගිය යන පද්‍ය නිර්මාණ යි. මේවායේ වස්තු විෂය, භාෂා භාවිතය හා ආකෘතිය පිළිබඳ ව මූලික අවධානය යොමු කරමින් පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

* වස්තු විෂය

නැළවිල්ල - කුඩා බිළිඳකුගේ නින්ද වෙනුවෙන් සමස්ත පරිසරය සූදානම් වී සිටින ආකාරය ප්‍රතිනිර්මාණය කිරීම.

කුකුළු හැවිල්ල - තම කුකුළා සොරකම් කළ මිනිසා අකා මකා දමන ලෙස කිසි යම් පුද්ගලයකු විසින් දෙවියන්ට කන්නලව් කරනු ලැබීම.

මඟුල් ගිය - වසන්ත සමයේ දී සිව්-අජිව් පරිසරය තුළ ඇති වන අතිශය ප්‍රබෝධවත් ස්වරූපය ප්‍රතිනිර්මාණය කිරීම.

* භාෂා භාවිතය

එහි ලක්ෂණ කිහිපයකි.

අමිශ්‍ර සිංහල ව්‍යවහාරය උපයෝගී කර ගැනීම.

උදා - "සඳ ද සිනිඳු රැස් කඳු
නොහෙළා බිම එක බඳු"

"සරංවී ඔබ මුව සිඹී
සිරි ඇඟ දැවැටී හොබී"

"ඇ" කාරය භාවිත කිරීම

උදා- "ලොවට මැ මඟුලක් සලසන්නී"
"මී වදවලැ පැණි පුරවන්නී"
"නිදි මව එයි වැළඳැ ගනියි"

ව්‍යංග්‍යාර්ථවත් භාෂාවක් යොදා ගැනීම

උදා - "මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබගේ පාළුය කා"

"මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී"

* පොදු ජන වහරේ යෙදුම් උපයෝගි කර ගැනීම

උදා - "කතරගමට රුහුණු රටෙ
හිතා කකා ලබන විටෙ
පයින් මැ ගොස් ඇවිදැ වටෙ
පොළොවැ උළා නළල් ඇටේ"

"දෙක දෙක එක් කර ඇඳන්නී"
"කෙල්ලන් කොල්ලන් පොබයන්නී"

* ආකෘතිය

මෙම කවින් ස්වකීය නිර්මාණවල අන්තර්ගතයට උචිත පරිදි නව ආකෘති නිර්මාණය කරන්නට පෙළඹී ඇත.

සිවුපද විරිත් භාවිතය, අඩු මාත්‍රා සංඛ්‍යාවක් ඇති වෘත්ත (විරිත්) භාවිතය, එක ම පද්‍ය රචනයක වුව ද මාත්‍රා ප්‍රමාණය වෙනස් වූ පද්‍ය අන්තර්ගත කිරීම, වස්තු විෂයට අදාළ ව කාව්‍ය වෘත්ත සකසා ගැනීම මෙහි ලා වැදගත් වේ.

මෙම කරුණු නිදසුන් සහිත ව විමසා බැලීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

(ලකුණු 15)

8. "මූලාශ්‍රයයේ නිරූපිත ස්වර්ණතිලකා චරිතය කෙරෙහි කතුවරයා හෙළන්නේ මානව දයාවෙන් යුතු දෘෂ්ටියකි." පෙමතො ජායතී සොකො නාට්‍යය ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

මූලාශ්‍රයයේ නිරූපිත ස්වර්ණතිලකා චරිතය කෙරෙහි කතුවරයා හෙළන මානව දයාවෙන් යුක්ත දෘෂ්ටිය පිළිබඳ ව සාකච්ඡා කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

පෙමතො ජායතී සොකො නාට්‍යය සඳහා මූලාශ්‍රය කර ගෙන ඇත්තේ ස්වර්ණතිලකා වස්තු වුව ද ඒ පැරණි කතාව නූතන වේදිකාවට ගැළපෙන පරිදි මානව හිතවාදී දෘෂ්ටියකින් ප්‍රතිනිර්මාණය කරන්නට නාට්‍ය රචකයා සමත් වී ඇත. එහි දී කැපී පෙනෙන්නේ ස්වර්ණතිලකා චරිතය කෙරෙහි වූ කතුවරයාගේ ආකල්පය යි. එය මානව හිතවාදී ගුණයෙන් අනූන වූවකි. එම චරිතයේ අන්තර්ගත සියුම් බවත්, අනාගතය විනිවිද දැකීමේ හැකියාවත්, යහපත් ආකල්පත් යථා අයුරින් නිරූපණය කිරීම කතුවරයාගේ අරමුණ වී ඇත. මෙම ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ලිවීමේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳ ව අවධානය යොමු කිරීම සුදුසු ය.

* ස්වර්ණතිලකා පංචමධූරා පුරයට පැමිණීමේ අරමුණ.
* සැඩොල් තරුණයාගේ විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම නිසා නිතරුණේ රාජ උදහසට ලක් වීම.
* උද්දාල බමුණාගේ විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට ඇය ඉදිරිපත් කරන හේතු
* උද්දාල බමුණාගේ ප්‍රේමය පිළිගැනීම හමුවේ ඇ තුළ ජනිත වන සතුට හා එම සතුට පිළිබඳ ව නිරන්තරයෙන් මතු වන සැක සංකා
* ශිෂ්‍යයන්ගේ නොසන්සුන්තාව පිළිබඳ යථාවබෝධය හා උද්දාල නැවත සිප් සලට යැවීමට දරන ප්‍රයත්නය
* ශිෂ්‍යයන් ඇ පිළිබඳ ව අනවබෝධයෙන් සිදු කරන කුමන්ත්‍රණ
* උද්දාල නැති අතර ශිෂ්‍යයන් ඇ බැහැරට ගෙන යාමට දරන ප්‍රයත්නය හා ඇගේ අසරණභාවය
* ශිෂ්‍යයන්ගේ සෝපහාසයෙන් යුත් කියුම්
* ස්වර්ණතිලකාගේ මරණය සිදු වූ ආකාරය
* උද්දාලගේ පසු තැවීම

"එසේ වී නම් ස්වර්ණතිලකා
මැරුම් කෑවේ මා අතින්ම යි."

මෙවැනි කරුණු නිදසුන් මඟින් සනාථ කරමින් පිළිතුර ලියා තිබීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 15)

4. (අ) පහත සඳහන් වාක්‍යවල දෝෂ ඇත් නම් ඇතොත් නිදොස් කොට ලියන්න.
   (i) කොග්ගල මහා ප්‍රාඥයා නොහොත් මාර්ටින් වික්‍රමසිංහ 'ගම්පෙරළිය' ලිව්වේ ය.
   (ii) අලින් සඳහා වෙන් කරන ලද අභයාරණ්‍යයක් මින්නේරිය ඇත.
   (iii) කුමාරතුංග මුනිදාස ව්‍යාකරණඥයෙක් ද පද්‍ය රචකයෙක් ද වෙයි.
   (iv) සතුටින් පැන නැඟී කොල්ලදාසුවෝ ඇඟපතින් හඬා සිටිති.
   (v) මවුවරුන් විනාහි ළපෙන් සිතුවිලි ඇත්තෝ වෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.
   (i) දානපතියා මහා නිවාසයට මුල්ගල තබයි.
   (ii) දුප්පත් ස්ත්‍රිය අසරණ දැරියක පෝෂණය කළා ය.
   (iii) විචාරකයෝ භාරතීය දාර්ශනිකයන් අගය කරති.
   (iv) නියෝජිතයෝ එකී පර්යේෂණය සඳහා මා තෝරා ගත්තෝ ය.
   (v) භක්තිමත්තයෝ දෙවියන් අදහති.

(ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.
   (i) (ගොවියෝ/ගොවියන්) සුදුසු කාලය බලා බිජ (වපුරති/වපුරනු ලබති.)
   (ii) කීර්තිමත් (පුරාවිද්‍යාඥයකු/පුරාවිද්‍යාඥයෙක්) වූ පරණවිතාන සූරියා (පර්යේෂකයෙක්/පර්යේෂකයකු) ද වෙයි.
   (iii) චිත්‍රපටය (නායකයෙක් හෝ නායිකාවක්/නායිකාවක් හෝ නායකයෙක්) නිදහස් උදෙසා සටන් (වන්නේ ය/වන්නෝ ය.)
   (iv) (තෙදැත්තෝ ද බලැත්තෝ ද/ තෙදැත්තන් ද බලැත්තන් ද) සමන්විතයි කලින් කල පහළ (වෙයි./වෙති.)
   (v) පෙරටුව (දේශමාමකයන්/දේශමාමකයෝ) සේ ජනතාව ඉදිරියේ පෙනී (සිටියි./සිටිති.)

(ලකුණු 05 x 3 =15 යි.)

04. (අ)

(i) කොග්ගල මහා ප්‍රාඥයා හෙවත් මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය ලිව්වේ ය.

(ii) නිවැරදි වාක්‍යයකි.

(iii) කුමාරතුංග මුනිදාස ව්‍යාකරණඥයෙක් ද පද්‍ය රචකයෙක් ද වෙයි.

(iv) නිවැරදි වාක්‍යයකි.

(v) මවුවරු වනාහි ළතෙත් සිතුවිලි ඇත්තෝ වෙති.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ආ)

(i) දානපතියා විසින් මහා නිවාසයට මුල්ගල තැබේ./තැබෙයි/තබනු ලබයි./තබනු ලැබේ./තබනු ලැබෙයි.

(ii) දුප්පත් ස්ත්‍රිය විසින් අසරණ දැරියක් පෝෂණය කරන ලද්දී ය/කරනු ලැබුවා ය.

(iii) විචාරකයන් විසින් භාරතීය දාර්ශනිකයෝ ඇගයෙති/ඇගයෙත්/අගය කරනු ලබති/ලැබෙති/ලැබෙත්/අගය කෙරෙත්. /ලබත්

(iv) නියෝජිතයන් විසින් එකී පර්යේෂණය සඳහා මම තෝරා ගන්නා ලද්දෙමි/ලදිමි/තෝරා ගනු ලැබුවෙමි./තෝරා ගැනුණෙමි.

(v) භක්තිවන්තයන් විසින් දෙවියෝ ඇදහෙති/අදහනු ලබති/ලබත්/ලැබෙත්/ලැබෙති.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ඇ)

(i) ගොවියෝ/වපුරති

(ii) පුරාවිද්‍යාඥයකු/පර්යේෂකයෙක්

(iii) නායිකාවක් හෝ නායකයෙක්/වන්නේ ය

(vi) තෙදැත්තෝ ද බලැත්තෝ ද /වෙති

(v) දේශමාමකයන් / සිටිති

(ලකුණු 01 x 5 = 05 යි.)



CamScanner

5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු-අංගය දක්වන්න.

(i) **ගල්කැටයම්** පෙළින් අලංකෘත මහා ප්‍රාසාදයෝ නගර **ගර්භයෙහි දීප්තිමත්** ව බැබළෙති.
(ගල්කැටයම් - සමාස, ගර්භයෙහි - විභක්ති, දීප්තිමත් - තද්ධිත)

(ii) දරිද්‍රතාවෙන් **පෙළුණු ශිෂ්‍යාශිෂ්‍යාවෝ ඔවුනොවුන්** අතර ආහාර බෙදා ගනිති.
(පෙළුණු - කෘදන්ත, ශිෂ්‍යාශිෂ්‍යාවෝ - සමාස, ඔවුනොවුන් - සන්ධි)

(iii) **නිලුපුලින්** ගෙතූ ද සාදල්ලෙන් **රතදර** ද දැක්වූ **අංගනාවෝ** සිඹ මොව් සරති.
(නිලුපුල් - සන්ධි, රතදර - සමාස, අංගනාවෝ - විභක්ති)

(iv) **බලවත්තයන් මෙන්** ම ධනවින්තයෝ ද මේ දුර්භික්ෂ කාලයෙහි පීඩාවට පත් **වෙති**.
(බලවත්තයන් - විභක්ති, මෙන් - නිපාත, වෙති - ක්‍රියා)

(v) **ලේකම්තුමා** අංක 27 **දරන** චක්‍රලේඛය **උපුටා** දැක්වී ය.
(ලේකම්තුමා - විභක්ති, දරන - කෘදන්ත, උපුටා - ක්‍රියා) (ලකුණු 03 x 5 = 15 යි.)

05.

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| i ගල්කැටයම් | සමාස | (කරණ) විභක්ති සමාස/ විබත් සමස් |
| ගර්භයෙහි | විභක්ති | ආධාර විභක්ති/අදර විබත |
| දීප්තිමත් | තද්ධිත | අස්ත්‍යර්ථයේ තද්ධිත |
| ii පෙළුණු | කෘදන්ත | (කර්මකාරක) අතීතකාල කෘදන්ත |
| ශිෂ්‍යාශිෂ්‍යාවෝ | සමාස | දකාරාර්ථ සමාසය/ ද අරුත් සමස් |
| ඔවුනොවුන් | සන්ධි | ස්වර සන්ධිය |
| iii නිලුපුලින් | සන්ධි | ස්වර සන්ධිය |
| රතදර | සමාස | විශේෂණ සමාස/විශේෂණ පූර්ව පද සමාසය |
| අංගනාවෝ | විභක්ති | ප්‍රථමා විභක්තිය/පෙර විබත |
| iv බලවත්තයන් | විභක්ති | කර්ම විභක්තිය/කම් විබත |
| මෙන් | නිපාත | උපමාවාචී නිපාත/උපමාද්‍යෝතක නිපාත |
| වෙති | ක්‍රියා | (වර්තමාන කාල) අවසාන ක්‍රියා |
| v ලේකම්තුමා | විභක්ති | ප්‍රථමා විභක්ති/ පෙර විබත |
| දරන | කෘදන්ත | (කර්තෘකාරක) වර්තමාන කාල කෘදන්ත |
| උපුටා | ක්‍රියා | පූර්ව ක්‍රියා/පෙරකිරිය |

(ලකුණු (1x 3 ) x 5 = 15



CamScanner

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විස්ලේෂණාත්මක රචනයක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) ලෝක සාමය උදෙසා ජගත් සංවිධාන සතු වගකීම
(ii) ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග
(iii) කඩිනම් විසඳුම් සෙවිය යුතු ශ්‍රී ලංකාවේ ළමා මන්ද පෝෂණය
(iv) අධ්‍යාපන ප්‍රතිපත්ති සහ රැකියා වෙළෙඳපොළ
(v) වර්තමාන ශ්‍රී ලාංකේය දේශපාලනය හා තරුණ ප්‍රජාව (ලකුණු 25 යි.)

වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශිකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

* විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

(ලකුණු 2



CamScanner

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

> පෙළ පොත් නිෂ්පාදනය සැලසුම් සහගත ව කළ යුත්තකි. මෙහි දී ඒ සම්බන්ධයෙන් අංග තුනක් වැදගත් වෙයි. එනම්, තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම යි. තීරණ ගනු ලබන්නේ භාෂා ඉගැන්වීමට අදාළ ආයතන යි. මේය රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික මට්ටමින් ක්‍රියාත්මක වන ආයතන විය හැකි ය. අදාළ බලධාරීන් විසින් පෙළ පොතට සම්බන්ධ භාෂා පාඨමාලාවේ අරමුණු, ඉගැන්වීමේ ක්‍රමවේද හා පෙළ පොත් සම්පාදනයේ ක්‍රියාවලිය පිළිබඳ මූලික තීරණ ගනු ඇත. පාඨමාලාවේ අරමුණු ජාතික, ආයතනික හෝ පෞද්ගලික විය හැකි ය.
>
> භාෂා ඉගෙනීම ශිෂ්‍යයාගේ මූලික හා ඒකායන අරමුණ සාධනයක් වුවත් ඉගැන්වීමේ ක්‍රියාවලියට සම්බන්ධ ගුරුවරුන්ට හා බලධාරීන්ටත් අදාළ ආයතනවලටත් පොදු අරමුණු මෙන් ම, ජීවන සංවර්ධනය, ප්‍රතිලාභ වැනි අරමුණු ද තිබිය හැකි ය. මේ සමහර ඒවා ප්‍රකාශිත මට්ටමේ පවතින ඒවා ය. අනෙක් ඒවා අප්‍රකාශිත හෝ සැඟවුණු මට්ටමේ ඒවා විය හැකි ය. ආයතනික මට්ටමෙන් ප්‍රතිලාභ ලබා ගැනීමත් කීර්තිය දිනුම කර ගැනීමත්, සමහර විට ඒවා සම්බන්ධයෙන් කිසියම් මතවාදයක් පැතිරවීමත් ගුරුවරුන් වශයෙන් වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමත් අප්‍රකාශිත අරමුණු විය හැකි ය. කුසලතා සංවර්ධනය, ආකල්ප සංවර්ධනය, ධනාත්මක චින්තනය පැතිරවීම ආදිය ප්‍රකාශිත අරමුණු අතර තිබිය හැකි ය. මේ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සලකා බලන විට මධ්‍යම මට්ටමේ බලධාරීන් හා ගුරුවරුන් මඟින් එය සිදුවන බව නිරීක්ෂණය කළ හැකි ය.
>
> (ලකුණු 13 යි)

(ආ) පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතු ය.

- ➢ පෙළ පොත් නිෂ්පාදනය සැලසුම් සහගත ව කළ යුත්තකි.
- ➢ එහි දී වැදගත් වන අංග තුන නම්: තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම
- ➢ භාෂා ඉගැන්වීමට අදාළ ආයතන විසින් තීරණ ගනු ලැබිය යුතු අතර ඒ ආයතන හෝ අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික හෝ විය හැකි ය.
- ➢ භාෂා ඉගෙනීම ශිෂ්‍යයාගේ ඒකායන අරමුණ වුව ද ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බ පිරිසට ඊට විවිධාකාරයේ අරමුණු තිබිය හැකි ය.
- ➢ නිලධාරීන්ට සහ ආයතනයන්ට ප්‍රකාශිත හා අප්‍රකාශිත අරමුණු තිබිය හැකි ය. ඒ මතවාදයක් පැතිරවීමත් ගුරුවරුන් වශයෙන් වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමත් අප්‍රකාශිත අරමුණු ය. කුශලතා සංවර්ධනය, ආකල්ප සංවර්ධනය, ධනාත්මක චි පැතිරවීම ප්‍රකාශිත අරමුණු ය.
- ➢ තීරණ ක්‍රියාත්මක කිරීම මධ්‍යම මට්ටමේ බලධාරීන් සහ ගුරුවරුන් මඟින් සිදු

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාං ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇති නම්, සමස්තයෙන් ලකුණු දෙ වේ. වචන සංඛ්‍යාව 60 - 70 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ න ප්‍රමාණයට නියමිත ලකුණු 2ක් අඩු වේ.

| | |
|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - ලකුණු 02 යි. |
| භාෂා නිරවද්‍යතාවට | - ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - ලකුණු 08 යි. |

CS CamScanner

## II කොටස

● මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉතා පුළුල් ලෙස අරුත් දක්වතොත් කාර්මික අධ්‍යාපනය යනුවෙන් අදහස් කෙරෙනුයේ ප්‍රජා අවශ්‍යතා සපුරාලන වෘත්තීය කාර්යයන් කාර්යක්ෂම ව කළ හැකි වන සේ ජනයාගේ කුසලතා වර්ධනය කිරීම යි. මේ කුසලතා පරපුරින් පරපුරට ලබා දීම කාර්මික අධ්‍යාපන පරිපාටියට ඇතුළත් ය. සමාජ-ආර්ථික තත්ත්වයත් රටේ කාර්මික විද්‍යාවත් විවිධ ශිල්පත් දියුණු වී තිබෙන ප්‍රමාණය වැනි සාධක කිහිපයක් ම කවර අවස්ථාවේ දී වුවත් රටේ කාර්මික අධ්‍යාපනයේ ස්වරූපය නිශ්චය කිරීමට අදාළ වේ. නිෂ්පාදන කටයුතු කුඩා වූ ද දේශීය අවශ්‍යතා සපුරා ලීමට මුළුමනින් ම සකස් කරන ලද ශිල්පක්‍රම මෙහෙයවීන් කරන් ව ද පැවති කල්හි භාණ්ඩ නිෂ්පාදනය ප්‍රමුඛ ශිල්පීන්ගේ නිවෙස්වලද කම්හලට සීමා විය. එබැවින් කාර්මික අධ්‍යාපනය දීමේ පිළිවෙත ද සාම්ප්‍රදායික ඇතුම දුන් පිළිවෙතට සමාන විය. අතවැසියා (ආධුනිකයා) ප්‍රමුඛ ශිල්පියාගේ සේවණෙහි විසී ය. ඔහු ස්වාමියාගේ ගෙදර දොරේ වැඩපළට උදවු වෙමින් ද කම්හලේ වැඩට සහාය වෙමින් ද ශිල්පක්‍රම සහ ගුරුකුළට උගත්තේ ය. මේ අතර තම ස්වාමි තත්ත්වයට සරිලන ජීවන දර්ශනයක් හා ජීවන ක්‍රමයක් ඇති කර ගත්තේ ය. පාරම්පරික රටාවක පැවති කාර්මික අධ්‍යාපනයෙන් ලබාදිය නොහැකි වූ විවිධ දක්ෂතා සමූහයක් අවශ්‍ය විට අපේ රටේ භාණ්ඩ නිෂ්පාදනය සිදුකළ යන්ත්‍ර බලය යෙදවීමත් කාර්මික සංවර්ධනයත් හේතු නොවී නොත ය.

දේශපාලනය සහ ආර්ථික අංශවල ඇති වුණු වෙනස්වීම් සමාජ ක්‍රමය කෙරෙහි බලපායි. මේ බලපෑම් කිල පාරම්පරික අධ්‍යාපනය සඳහා ඇති කරනු ලබන අධ්‍යාපන ආයතනවලින් පිළිබිඹු වේ. ඉංග්‍රීසි සියවස මැද භාගයේ දී බ්‍රිතාන්‍යයන් තම දේශපාලන බලය මෙහි තහවුරු කළේ වඩා කාර්යක්ෂම පාලන ක්‍රමයක් මඟිනි. එහි ලා උපයෝගි කර ගන්නා ලද බලගතු ආයුධය අධ්‍යාපනය යි. බටහිරින් ආභාසය ලත් අධ්‍යාපන ක්‍රමය නිසා චිරන්තන ගුරු-ගෝල පිළිවෙත වෙනුවට පාසල් ගුරුවරයකු යටතේ විශාල සිසු පිරිසකට පන්ති කාමරයක ඉගැන්වීමේ පිළිවෙත බිහි වූයේ ය. මේ පිළිවෙත එංගලන්තයේ පැවති අධ්‍යාපන ක්‍රමය අනුව සකස් කරන ලද්දේ ය. මෙහි විෂය මාලාව ද ජනතාවගෙන් විශාල කොටසකගේ අවශ්‍යතා හා කිසිසේත් සම්බන්ධ නොවී ය.

වඩා ප්‍රායෝගික වූ අධ්‍යාපනයක් දීමට මුලින් ම කැප කරන ලද්දේ මිෂනාරි සංවිධාන විසිනි. ඔවුහු සාමාන්‍ය අධ්‍යාපනය උදෙසා වියදම් දැරීමට නොහැකි දුප්පත් පන්තිවල ළමයින්ට යම් ශිල්පයක් පුහුණු කිරීම පිණිස 'කාර්මික පාසල්' ආරම්භ කළහ. මින් මුල් ම ආයතනය 1859 දී ජේ. තර්ස්ටන් පූජකවරයා විසින් කොල්ලුපිටියේ පිහිටුවන ලදී.

(i) කාර්මික අධ්‍යාපනයේ ස්වරූපය නිශ්චය කිරීමෙහි ලා මූලික වන කරුණු මොනවා ද?
(ii) අතීතයේ ශිල්පක්‍රම උගත්තේ කෙසේ ද?
(iii) කාර්මික පාසල් ආරම්භ කිරීමේ පරමාර්ථය කුමක් ද?
(iv) තම දේශපාලන බලය තහවුරු කර ගැනීමෙහි ලා බ්‍රිතාන්‍යයන් වඩා බලගතු සේ සැලකුයේ කුමක් ද?
(v) ගුරුවරයකු යටතේ විශාල සිසු පිරිසකට පන්ති කාමරයක ඉගැන්වීමේ පිළිවෙත ආරම්භ වූයේ කුමන බලපෑමකින් ද?
(vi) මෙහි දැක්වෙන ආකාරයට කාර්මික අධ්‍යාපනයක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණය කුමක් ද?

(ලකුණු 02 × 6 = 12 යි.)

(2) (අ)

(i) සමාජ - ආර්ථික තත්ත්වය, රටේ කාර්මික විද්‍යාව හා විවිධ ශිල්ප දියුණු වී තිබෙන ප්‍රමාණය.
(කරුණු 3 ම තිබේ නම් ලකුණු 2 යි. කරුණු දෙකකට ලකුණු 1 යි. කරුණු එකක් නම් ලකුණු නැත.)

(ii) අතවැසියා (ආධුනිකයා) තම ස්වාමියාගේ ගෙදර දොරේ වැඩපළට උදව් වෙමින් ද කම්හලේ වැඩට සහාය වෙමින් ද ශිල්පක්‍රම උගත යුතු ය.

(iii) සාමාන්‍ය අධ්‍යාපනය උදෙසා වියදම් දැරීමට නො හැකි දුප්පත් පන්තිවල ළමයින්ට යම් ශිල්පයක් පුහුණු කිරීම කාර්මික පාසල් පිහිටුවීමේ පරමාර්ථය වී ඇත.

(iv) අධ්‍යාපනය [illegible]

(v) බටහිර ආභාසය ලත් අධ්‍යාපන ක්‍රමයේ බලපෑමෙන්

(vi) ප්‍රජා අවශ්‍යතා සපුරා ලන වෘත්තීය කාර්යයන් කාර්යක්ෂමව කළ හැකි වන සේ ජනයාගේ කුසලතා වර්ධනය කිරීම.

(ලකුණු 02 x 06 = 12

* [illegible]



CS CamScanner

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වරහන් තුළ දී ඇති පද අතුරෙන් සුදුසු පදය තෝරා ලියන්න.

(i) [illegible] ...................... [illegible] වැඩිවූයේ ය.

(ii) [illegible] ...................... [illegible] ය.

(iii) ඒ ...................... [illegible] වැඩි ය.

(iv) [illegible] ...................... [illegible]

(v) [illegible] ...................... [illegible] ය.

(vi) [illegible] ...................... [illegible]

(වෙස්, වැකන්, පෙම්, වේගය, හරවත්, ප්‍රේමය) (ලකුණු ½ × 6 = 03 යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) මං + පැහැරීම (ii) සත් + දවස (iii) ආප්ත + උපදේශ
(iv) තත් + අරුත් (v) මූල + අක්ෂර (vi) වහර + අනුසෙරෙන්
(ලකුණු ½ × 6 = 03 යි.)

(ඇ) [illegible]

(i) "මල්ලියේ, මල්ලී ඉන් ද ආවේ?" අක්කා ප්‍රශ්න කළා ය.
(ii) [illegible]
(iii) [illegible] (ලකුණු ½ × 6 = 03 යි.)

(ඈ) [illegible]
(ලකුණු ½ × 6 = 03 යි.)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශවල [illegible] ලියන්න.

(i) "අපි රට වෙනුවෙන් අපගේ වැටුප පරිත්‍යාග කරමු" යි [illegible].
(ii) [illegible]
(iii) [illegible] (ලකුණු 01 × 3 = 03 යි.)

(6). (අ)

(i) වැකන්.

(ii) වේගය.

(iii) හරවත්.

(iv) ප්‍රේමය.

(v) පෙම.

(vi) වෙස්.

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(ආ)

(i) මංපැහැරීම.

(ii) සද්දවස.

(iii) ආප්තෝපදේශ.

(iv) තනරුත්.

(v) මූලාක්ෂර.

(vi) වහරනුසෙරෙන්.

(ලකුණු 1/2 x 6 = 3 යි.)



CamScanner

(ඉ)

| | | | |
|---|---|---|---|
| (i) | මල්ලියේ | - | ආලපන විභක්ති/අලප් විබත |
| | අක්කා | - | ප්‍රථමා විභක්ති/පෙර විබත |
| (ii) | සාරියකින් | - | කරණ විභක්ති/කරණ විබත. |
| | මුහුණෙහි | - | ආධාර විභක්ති/අදර විබත. |
| (iii) | රාලහාමිගේ | - | සම්බන්ධ විභක්ති/සබඳ විබත. |
| | කටහඬ | - | කර්ම විභක්ති/කම් විබත. |

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(ඊ) නාටිකාංගනාවෝ සභා ගර්භයට පිවිස, මන්දහාසය නංවා, අත්පා තාලානුරූපී ව නගා නර්තනය පටන් ගත්හ. ප්‍රේක්ෂකයෙනි, මෙවන් රංගනයක් කවර කලෙක වේ ද? අහා! ඒ රංගශෝභාව විචිත්‍ර ය; දර්ශනීය ය; රමණීය ය. (විචිත්‍ර ය, දර්ශනීය ය, ... යනුවෙන් තිබුණ ද ලකුණු දෙන්න.)

(ලකුණු 1/2 x 6 = 3 යි.)

(උ)

(i) තමන් රට වෙනුවෙන් තමන්ගේ වැටුප පරිත්‍යාග කරන බව නායකයෝ කීහ.

(ii) තාපසයා, මගියා අමතා ඒ මාර්ගයෙන් නික්මෙන ලෙස උපදෙස් දුන්නේ ය.

(iii) තමා පසු දින ශ්‍රී ලංකාවෙන් පිට ව යන බව විදේශිකයා පැවසී ය.

(ලකුණු 1 x 3 = 3 යි.)



CS CamScanner

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෘතුගීසි **ආක්‍රමණිකයාගේ** තාඩන-පීඩනයන්ගෙන් ලංකාවාසී ජනතාව **අතිශය** වේදනීය ඉරණමකට මුහුණ දුන් **අවධියක්** සේ සීතාවක රාජසිංහ රාජ්‍ය සමය හැඳින්විය හැකි ය. ප්‍රතාපවත් රණශූරයකු, **අහිත** නායකයකු සේ කීර්තිමත් භාවයකට හිමිකම් කී රාජසිංහයෝ පරදේශීන් ශ්‍රී ලංකාද්වීපයෙන් පලවා හැරීමේ සටන ඇරඹූහ. ඇත්අස්රියපාබළ යන චතුරංගිනී සේනාවෙන් සමලංකෘත මහ පිරිස මුල්ලේරියා වෙල්යාය අවට කඳවුරු බැඳ ගත්තේ විදේශීය සතුරන් මුලිනුපුටා දැමීමේ ස්ථිර අධිෂ්ඨානයෙනි. ලංසිකයාගේ භාග්‍යයකට මෙන් පෘතුගීසීන්ට තම රටින් කිසිදු **අමතර** උදව්වක් නො ලැබිණි. යුද්ධායුධ හිඟ විය; ආහාර පාන **අවසන්** විය; කොළඹ කොටුවේ බළල් මස් පවා හිඟ ගණන් විය. ඔවුන් රාජසිංහයන්ගේ යුද්ධ වික්‍රමය හමුවේ කෙතරම් හීන-දීන පරාජිත තත්ත්වයට පත් වී ද යත්, මුල්ලේරියා වෙල් වතුර ඔවුන්ගේ රුධිරයෙන් රත් පැහැ ගැන්වුණේ ය. එමනිසා රාජසිංහ නාමය **අද්විතීය** වූවක් සේ ලංකා යුද්ධ ඉතිහාස වංශ කතාවේ රනකුරින් ලියැවුණේ ය.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.
(ii) මුලිනුපුටා, යුද්ධායුධ, රනකුරින් යන වචන විසන්ධි කරන්න.
(iii) දකාරාර්ථ සමාස පද තුනක් ඡේදයෙන් උපුටා දක්වන්න.
(iv) පෘතුගීසි, රාජසිංහයෝ, මුල්ලේරියා යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.
(v) මෙම ඡේදයෙහි ඇතුළත් ඝෝෂ හා අඝෝෂ මහාප්‍රාණ දෙකක් අන්තර්ගත වචනයක් ලියන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

(i) අතිශය, අද්විතීය, අහිත, අමතර, අවධියක්, අවසන්, ආක්‍රමණිකයාගේ

(මෙහි වචනයක් හෝ අඩු නම්, එක වචනයක හෝ අකාරාදි පිළිවෙළ වැරදි නම් ලකුණු හිමි නො වේ.)

(ලකුණු 03 යි.)

(ii) මුලින් + උපුටා.
යුද්ධ + ආයුධ.
රන් + අකුරින් (ලකුණු 1 x 3 = 3 යි.)

(iii) ඇත්අස්රියපාබළ.
තාඩන-පීඩනයන්ගෙන්.
ආහාර-පාන.
හීන-දීන.

(ලකුණු 1 x 3 = 3 යි.)

(iv) පෘ - ගැටය සහිත ඇලපිල්ල.
තු - කෙටි පාපිල්ල.
ගී - දීර්ඝ ඉස්පිල්ල.
සි - කෙටි ඉස්පිල්ල.

රා - ඇලපිල්ල.
සි - කෙටි ඉස්පිල්ල.
යෝ - කොම්බුව, ඇලපිල්ල සහ දීර්ඝත්ව ලක්ෂණය.

මු - කෙටි පාපිල්ල.
ලේ - කොම්බුව සහ දීර්ඝත්ව ලක්ෂණ
රි - කෙටි ඉස්පිල්ල
යා - ඇලපිල්ල

(ලකුණු 1 x 3 = 3 යි.)

අධිෂ්ඨානයෙනි

(ලකුණු 3 යි.)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
(i) ස්වර සන්ධිය
(ii) ආශිර්වාද ක්‍රියාව
(iii) අව්‍යය සමාසය
(iv) උපසර්ග
(v) භාව කාරක කෘදන්ත (ලකුණු 05 × 3 =15 යි.)

08. (i) ස්වර සන්ධිය

සන්ධි වන පද දෙකේ පෙර පදයේ අග ඇති හල් අකුරත් පසු පදයේ මුල ඇති ස්වරයත් එකට එක් වීමෙන් ගැළපෙන සන්ධිය යි.

උදා - සහස් + ඇස් → සැ → සහසැස්

සිහිල් + ඇති → ලැ → සිහිලැති

නිල් + අඹර → ල → නිලඹර

රුවන් + ආර → නා → රුවනාර

ඔවුන් + ඔවුන් → නො → ඔවුනොවුන්

මල් + අසුන → ල → මලසුන

(ii) ආශිර්වාද ක්‍රියා.

කිසි යම් ආශිර්වාදයක් හෝ ප්‍රාර්ථනයක් හෝ හඟවන ක්‍රියා පද ආශිර්වාද ක්‍රියා වශයෙන් හැඳින්වේ. ආශිර්වාද ක්‍රියා අනාගත කාලයේ පමණක් යෙදේ. උත්තම, මධ්‍යම, ප්‍රථම යන පුරුෂ තුනේ ම යෙදෙන ආශිර්වාද ක්‍රියා ඒක වචන, බහු වචන යන වචන දෙකේ ම ද යෙදේ.

උදා - මම නිදුක් වෙම්වා!
අපි නිදුක් වෙමුවා!
තෝ නිදුක් වෙහිවා!
තොපි නිදුක් වෙහුවා!
ඔහු නිදුක් වේවා!
ඔවුහු නිදුක් වෙත්වා!

(iii) අව්‍යය සමාසය.

නිපාත හෝ උපසර්ග පදයක් හෝ මුලට යෙදී පද කැටි වූ විට එය අව්‍යය සමාසය වේ. අව්‍යය සමාසයේ ප්‍රභේද හතරකි.

1. 'යව්' ආදි ගණය.

යව් ගණයට අයත් යව්, යාව, යත, යථා, තාව, අනු ආදි අව්‍යය පදයක් යෙදී සමාස වේ.

උදා :- යව් + දිව් - යව්දිව්.



CamScanner

2. 'කු' ආදි ගණය.

අර්ථය දූෂ්‍ය හෝ තිව්‍ර හෝ කරන කු, දු, සු, ස, අව වැනි අව්‍යය පදයක් යෙදී සමාස වේ.

උදා:- කු + දිටු - කුදිටු

සු + දන - සුදන

3. 'ප' ආදි ගණය.

උතුම්, සමීප යන අර්ථය දෙන ප, ප්‍ර, උප, පර ආදි උපසර්ග එක් වීමෙන් සෑදෙන සමාස මේ ගණයට අයත් වේ.

උදා:- ප්‍ර + බල - ප්‍රබල

ප + වර - පවර

4. 'න' ආදි ගණය

නැත යන අර්ථය දෙන 'න', 'නො', ආදි නිපාත එක් වීමෙන් සෑදෙන සමාස යි. 'න' ආදේශ වන පදයේ මුල ස්වරයක් වෙතොත් 'අන්' ආදේශ වන අතර ව්‍යංජනයක් වෙතොත් 'අ' ආදේශ වේ.

උදා:- න + අදර - අනදර

න + කුසල් - අකුසල්

(iv) උපසර්ග

නාම ප්‍රකෘතියකට හෝ ධාතු ප්‍රකෘතියකට හෝ පෙර එම පදයේ අර්ථයට යම් විශේෂයක් එක් කරන පද උපසර්ග වේ. උපසර්ගය සහ ප්‍රකෘතිය වෙන් කොට නො යෙදේ.

සිදත් සඟරාවේ යෙදෙන උපසර්ග නම්, ප, පර, අව, ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අබි, පිරි, උප, අප, පස්, පිළි, අති, පි.

උදා :- නිකෙලෙස්, දුලද, පබල, පවර

සංස්කෘත භාෂාවේ යෙදෙන උපසර්ගත් ඇතැම් විටෙක මිශ්‍ර සිංහල ව්‍යවහාරයේ යෙදේ. ඒවා නම්, ප්‍ර, පරා, අප, සං/සම්/සන්, අනු, අව, නිග්/ නිෂ්/ නිස්, දුෂ්/ දුර්/ දුස්, වි, ආ, නි, අධි, අපි, අති, සු/උත්/උද්, අභි, ප්‍රති, පරි, උප යන ඒවා යි.

උදා :- අනුබල, ප්‍රබන්ධ, දුෂ්කර, අභිමත, ප්‍රතික්‍රියා.

✶ පාසල් පෙළ පොත්වලට අනුව 'කු' යන්න ද උපසර්ගයක් සේ ගෙන ඇත.

(v) භාව කාරක කෘදන්ත

කර්තෘ හෝ කර්ම හෝ අර්ථයක් නො දී හුදු ක්‍රියා මාත්‍රයක්, ක්‍රියා භාවයක් හඟවන පද භාව කාරක කෘදන්ත යි. ධාතුවකට පරව නු, උම්, ඊම්, ඉලි, මන් යන ප්‍රත්‍යයන් එක්වීමෙන් මෙම කෘදන්ත පද සෑදේ.

උදා - ලිය + නු - ලියනු

ලිය + උම් - ලියුම්

ලිය + ඊම් - ලිවීම්

ලිය + ඉලි - ලියවිලි

ලිය + මන් - ලියමන්

(මෙහි හැඳින්වීමට ලකුණු 02 යි. උදාහරණවලට ලකුණු 03 යි.)

(ලකුණු 05 බැගින් මුළු ලකුණු 5 x 3 = ලකුණු 15 යි.)



WWW.PastPapers.WIKI
Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!
CamScanner